**කින්නියා ප්‍රාදේශීය සභාව**
**ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2011 ජුලි 18 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, ඉකුත් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 ඔක්තෝබර් 15 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි.

1.2 **මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව කින්නියා ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කින්නියා ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු.**

(අ) රු.6,540,350 ක් වටිනා ස්ථාවර වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දි ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි.

(ආ) හිඟ හිටි වෙළඳ බලපත්‍ර ගාස්තු රු.19,700 ක මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

1.3.2 **ගෙවියයුතු ගිණුම්.**

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 කාලයක් ඉක්මවා තිබූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.2,325,758 ක් විය.

1.3.3 **බැංකු ගිණුම්.**

බැංකු සැසඳුම් සඳහා සිදු කරන ලද ගැළපීම්වලට අදාළ තොරතුරු පහත දැක්වේ.

| විස්තරය | අවස්ථා ගණන | කාල විශ්ලේෂණ<br>මාස 06ට වැඩි මාස 12ට අඩු කාලය | වර්ෂ 01 සිට 03 | එකතුව |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| නිකුත් කරන ලද නමුත්, ගෙවීම් සඳහා ඉදිරිපත් නොකරන ලද චෙක්පත්. | 170 | 475,289 | 402,951 | 878,240 |

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම.**

(අ) **පිළිතුරු නොලත් විගණන විමසුම්.**

2010 දෙසැම්බර් 31 දින වන විට විගණන විමසුම් 17 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එකී විමසුම්වලට භාජනය වූ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.1,459,463 ක් විය.

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම.</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.1,193,588 ක් වූ ගනුදෙනු විගණනයේ දි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 <u>අනුකූල නොවීම්</u>.

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාස, විධි විධානවලට හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේ දි නිරීක්ෂණය විය.

| | | නීති, රීති, රෙගුලාසී හා කළමනාකරණ තීරණවලට යොමුව. | අනුකූල නොවීම. |
|---|---|---|---|
| (අ) | | 1979 අංක 42 දරන මුද්දර පනත | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ලියාපදංචි ඔප්පු වෙනුවෙන් අය වියයුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. |
| (ආ) | | **1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත.** | |
| | (i) | 134 වන ජේදය | වරිපනම් බදු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| | (ii) | 152 වන ජේදය | වෘත්තීමය ක්‍රියාකාරකම්වල යෙදෙන පුද්ගලයින්ගෙන් අය වියයුතු බදු අය කර ගෙන නොතිබුණි. |
| | (iii) | 477 (4) වන ජේදය | ඇතිකරන සතුන් සඳහා බදු අදාල පුද්ගලයින්ගෙන් අයකරගෙන නොතිබුණිග |
| | (iv) | 66(1)(3)(4) වන ජේදය | අයාලේ යන ගවයින් සඳහා දඩ අය කර ගැනීමේ ක්‍රමයක් සභාව විසින් අනුගමනය කර නොතිබුණි. |
| (ඇ) | | **1989 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති** | |
| | (i) | 11 කොටසේ 16(1) ජේදය | චංචල හා නිශ්චල දේපළ වෙනුවෙන් ලේඛනයක් නඩත්තු කිරීමට ප්‍රාදේශීය සභාව කටයුතු කර නොතිබුණි. |
| | (ii) | 1 කොටසේ 5(xi) ජේදය | මුදල් හා ගබඩා යනාදිය භාර අයගෙන් රක්ෂණ ආවරණයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (iii) | 1 කොටසේ 5(xii) ඡේදය | මුදල් හා ගබඩා භාර සිටින නිලධාරීන්ගෙන් ප්‍රමාණවත් ඇප තැන්පතුවක් ලබා ගෙන නොතිබුණි. |
| (iv) | Vii කොටසේ වැඩ අංක 3(178)අ | ප්‍රසිද්ධ තරඟකාරීත්වයකින් තොරව රු.6,734,345 ක වටිනාකමැති කොන්ත්‍රාත් 18 ක් පිරි නැමීමට කටයුතු කර තිබුණි. |
| (v) | Vii කොටසේ ගිණුම් අංක 16/(165) | ප්‍රධාන ලෙජරය පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (vi) | Xii කොටසේ අංක 214 ඡේදය | සමීක්ෂණ මණ්ඩලය විසින් පහත සඳහන් අයිතම සමීක්ෂණයට භාවිතා කර නොතිබුණි.<br>I. මුද්දර<br>II. ලිපි ද්‍රව්‍ය<br>III. ගොඩනැගිලි හා අයදුම්පත්‍ර<br>IV. පරණ පුවත්පත් හා සඟරා |
| (vii) | Xii කොටසේ 217 වන පරිච්ඡේදය | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඈ) | මුදල් රෙගුලාසි අංක 387 | සමාලෝචිත වර්ෂයේ බැංකු ගිණුම් 02ට අදාලව රු.1,442,447 ක අයිරා ශේෂයක් පැවතුණි. |

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.4,039,439 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මව ආදායම රු.983,380 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය.</u>

2.2.1 <u>ඇස්තමේන්තු ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ හිටි ආදායම.</u>

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇසතමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| ආදායම් විෂයය | ඇසතමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (i) | වරිපනම් හා බදු | 07 | 06 | 152 | 03 | 43 | 152 |
| (ii) | බදු කුළී | 1,895 | 1,662 | 1,811 | 1,807 | 1,764 | 1,579 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 450 | 4,122 | -- | 328 | 157 | 171 |
| (iv) | වෙනත් ආදායම් | 1,847 | 5,616 | -- | 7,062 | 5,834 | -- |

2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ ත්‍රිකුණාමල මහේස්ත්‍රාත් අධිකරණය විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අය කර, ප්‍රධාන ලේකම්, පළාත් ආදායම් කොමසාරිස් වෙත එවා ඇති රු.1,812,620 ක් වූ සභාවට ලැබියයුතු උසාවි දඩ මුදල ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු.

සමාලෝචිත වර්ෂය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් අය වියයුතු මුද්දර ගාස්තු ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂයය | අයවැයගත<br>රු.000 | තථ්‍ය<br>රු.000 | විචලනය<br>රු.000 | අයවැයගත<br>රු.000 | තථ්‍ය<br>රු.000 | විචලනය<br>රු.000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 6,912 | 5,826 | 1,086 | 6,119 | 4,913 | 1,206 |
| අනෙකුත් | 7,526 | 2,092 | 5,434 | 9,747 | 1,461 | 8,286 |
| උප එකතුව | 14,438 | 7,918 | 6,520 | 15,866 | 6,374 | 9,492 |
| ප්‍රාග්ධන වියදම | 4,308 | 2,965 | 1,343 | 9,100 | 2,182 | 6,918 |
| මුළු එකතුව | 18,746 | 10,883 | 7,863 | 24,966 | 8,556 | 16,410 |

2.4 මානව සම්පත් කළමණාකරණය

2.4.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය | ඌනතාවය/ අතිරික්තය |
|---|---|---|---|
| මාණ්ඩලික | 01 | -- | 01 |
| ද්විතියික | 05 | 06 | (01) |

| | | | |
|---|---|---|---|
| ප්‍රාථමික | 12 | 11 | 01 |
| වෙනත් (අනියම්, තාවකාලික) | 18 | 05 | 13 |
| | ---- | ---- | ---- |
| එකතුව | 36 | 22 | 14 |
| | === | === | === |

2.5 **වත්කම් කළමනාකරණය.**

2.5.1 **නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිතව පැවති භෞතික සම්පත් පිළිබඳ නියැදි විගණන පරීක්ෂණවල දි අනාවරණය වු වත්කම් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | අයිතම | අයිතම සංඛ්‍යාව | කාලය | නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිතබව |
|---|---|---|---|---|
| | --------- | ---------------- | --------- | ----------------- |
| (අ) | ප්‍රින්ටරය LQ 2135 | 01 | අවුරුදු 01 | ඌන උපයෝජිත |
| (ආ) | ප්‍රින්ටරය LQ 5235 | 01 | අවුරුදු 01 | ඌන උපයෝජිත |
| (ඇ) | Laptop HP Computer | 01 | අවුරුදු 01 | නිශ්ක්‍රීය වත්කම් |
| (ඈ) | Tailor | 01 | අවුරුදු 01 | ඌන උපයෝජිත |
| (ඉ) | Mahendra Single Cab | 01 | මාස 06 | ඌන උපයෝජිත |
| (ඊ) | Multimedia Projector | 01 | මාස 06 | නිශ්ක්‍රීය වත්කම් |
| (උ) | Digital Camera | 01 | අවුරුදු 01 | ඌන උපයෝජිත |

2.5.2 **ලැබිය යුතු ගිණුම්**

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.5,839,632 ක් වු අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබු ගිණුම් ශේෂවල එකතුව රු.4,941,837 ක් විය.

2.5.3 **අයවීමට ඇති සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.951,864 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු.137,847 ක් විය.

2.5.4 **අචල ජංගම වත්කම්.**

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අචලව පවතින වත්කම් අගය රු.173,544 ක් විය.

2.5.5 **සමීක්ෂණය නොකළ වත්කම්.**

භෞතික සමීක්ෂණ/ සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොවු 2010 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ වත්කම්වල වටිනාකම රු.6,540,350 ක් විය.

2.6 **වාහන උපයෝජනය.**

(අ) ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) වාහන අලුත්වැඩියා වියදම් ලොග් පොත්වල නියමිත පරිදි සටහන් කර නොතිබුණි.

2.7 <u>අභ්‍යන්තර විගණනය.</u>

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) අයවැය පාලනය
(ඈ) ස්ථාවර වත්කම් පාලනය